## පළමුවන කියැවීම

ද්විතීය නීති සංග්‍රහය 6:1-6

ද්විතීය නීති සංග්‍රහය පොතෙන් ගත් පාඨයෙකි.

**ඔබේ මුළු හෘදයෙන් දෙවි ස්වාමීන් වහන්සේට ප්‍රේම කළ යුතුය.**

"ඔබට දිවි ඇති තාක්, ඔබත්, ඔබේ පුත්‍රයාත්, පුත්‍රයාගේ පුත්‍රයාත් දෙවි සමිඳාණන් වහන්සේට ගරු බිය පාමින්, මා ඔබට අණ කළ උන් වහන්සේගේ සියළුම නියෝග සහ අණ පණත් රක්ෂා කළ යුතුය. එසේ කළොත්, ඔබ චිරාත් කාලයක් ජීවත් වනු ඇත. එබැවින් ඉශ්‍රායෙල්වරුනි, සවන් දී ඒවා පිළිපදින්න. එසේ කළොත්, ඔබේ පියවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට පොරොන්දු වූ පරිදි කිරෙන් හා මී පැණියෙන් ඉතිරෙන දේශයෙහි ඔබට සුභ සිද්ධිය සැලසෙනු ඇත. ගණනින් ඔබ බහුල ව වර්ධනය වනු ඇත. ඉශ්‍රායෙල්වරුනි, සවන් දෙන්න, අපේ සමිඳාණන් වහන්සේ වන දෙවියන් වහන්සේ අසහාය සමිඳාණන් වහන්සේ ය. දෙවි සමිඳාණන් වහන්සේට ඔබේ මුළු හෘදයෙන් ද, ඔබේ මුළු සිතින් ද, ඔබේ මුළු වීර්යයෙන් ද ප්‍රේම කළ යුතුය. අද දින මා ඔබට දෙන මේ අණ පණත් සිතේ ධාරණය කර ගත යුතු ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 18:1-3, 46, 50

පිළිතුර: මාගේ සවි ශක්තිය වන සමිඳුනි, මම ඔබට ප්‍රේම කරමි.

ගීය: මාගේ සවි ශක්තිය වන සමිඳුනි, මම ඔබට ප්‍රේම කරමි. සමිඳාණෝ මාගේ පර්වතය ය. බලකොටුව ය. මිදුම්කාරයාණෝ ය. ඔබ මා දෙවිඳාණෝ ය. පර්වත රජිඳාණෝ ය. මම ඔබ සරණ කොට ගනිමි.

ඔබ මට පළිහ ය. ගැළවීමේ බලය ය. උස් කොටු පවුර ය. සියලු පැසසුම්වලට හිමිකම් ඇති සමිඳුනි, මම ඔබට ඇයද සිටිමි. මෙසේ මාගේ සතුරන් ගෙන් මම ගැළවෙන්නෙමි.

සමිඳාණෝ සැරදෙත්වා! මාගේ ප්‍රාකාරය වන එතුමන්ට පැසසුම් වේවා! මාගේ විමුක්තිදායකයාණෝ අන් හැමට ම පරමෝත්තම වන සේක. එතුමාණෝ සිය රජුට ජය සිරි දෙන දෙන සේක. තමන් අතින් අබිසෙස් ලත් දාවිත් රජුට ද ඔහුගේ වංශයට ද සදහට ම කරුණා කරන සේක.

## දෙවන කියැවීම

හෙබ්‍රෙව් 723-28

හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද හසුනෙන් ගත් කොටසකි.

**ජේසුස් වහන්සේ සදහට ම පවතින හෙයින් පූජක ධූරය අන් කෙනෙකුට පැවරිය නොහැකි ය.**

තවද, මරණය හේතුකොටගෙන පූජක පදවියෙහි පවතින්නට පූජකවරුන්ට නොහැකි වූ බැවින් පූජක සංඛ්‍යාව, විශාල විය. එහෙත්, ජේසුස් වහන්සේ සදහට ම පවතින හෙයින් උන් වහන්සේගේ පූජක ධූරය අන් කෙනෙකුට පැවරිය නොහැකි ය. එබැවින් උන් වහන්සේ මගින් දෙවියන් වහන්සේ වෙතට ළඟා වන්නන් සදහට ම ගලවන්නට

උන් වහන්සේට පිළිවන. මන්ද, ඔවුන් උදෙසා මැදහත් වීමට සදහට ම ජීවත් වන බැවිනි. අපට යෝග්‍ය වන්නේත් එබඳු ධාර්මික, නිර්දෝෂ, නිර්මල පව්කාරයන්ගෙන් වෙන් වූ, අහස් මඬල ඉක්මවා වැජඹෙන උත්තම පූජකයෙක්ම ය. අන් උත්තම පූජකයන් මෙන්, පළමු කොට තමන්ගේ පව් උදෙසාත්, දෙවනුව ජනතාවගේ පව් උදෙසාත්, දිනපතා පූජා ඔප්පු කිරීමට උන් වහන්සේට වුවමනාවක් නැත. මන්ද, උන් වහන්සේ තමන් ම එකම වරක් පූජා වීමෙන් ඒ වුවමනාව ඉටු කළ සේක. දුර්වලකම් ඇති මනුෂ්‍යයෝ උත්තම පූජකයන් කොට ව්‍යවස්ථාවෙන් පත් කරනු ලැබෙත්. එහෙත්, ව්‍යවස්ථාවෙන් පසුව පැමිණි දිවුරුමේ වචනයෙන් සදහට ම සම්පූර්ණ ව සිටින පුත්‍රයාණෝ පත් කරනු ලැබූහ.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සාධුකාරය</u>** ජුවාම් 6:63

ආලේලූයා! ආලේලූයා!
මා ඔබට වදාළ වචන ආත්මය ද ජීවනය ද වන්නේ ය.
සදතන ජීවනයේ වචන ඇත්තේ ඔබ වහන්සේ වෙතය.
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** මාක් 12:28-34

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**ශ්‍රේෂ්ඨතම ආඥාව මේ ය.**

විනයධරයන්ගෙන් කෙනෙක් පැමිණ, ඔවුන් එකතු වී උන්වහන්සේ සමග විවාද කරනු අසා, උන්වහන්සේ ඔවුන්ට මැනවින් පිළිතුරු දුන් බව ද දැක, "සියලු ආඥා අතරෙන් ශ්‍රේෂ්ඨතම ආඥාව කිමෙක්ද"යි උන්වහන්සේගෙන් ප්‍රශ්න කෙළේය. ජේසුස් වහන්සේ උත්තර දෙමින්, "ශ්‍රේෂ්ඨතම ආඥාව මෙය: 'ඉශ්රායෙල් වැසියෙනි, අසන්න, අපේ ස්වාමින් වන දෙවියන්වහන්සේ එකම ස්වාමින් වහන්සේය. නුඹේ මුළු හෘදයෙන් ද නුඹේ මුළු සිතින් ද නුඹේ මුළු බුද්ධියෙන් ද නුඹේ මුළු විර්යයෙන් ද නුඹේ දෙවි ස්වාමින් වහන්සේට ප්‍රේම කරන්න.' දෙවැන්න මේය: 'නුඹ නුඹටම ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල්වැසියාට ප්‍රේම කරන්න.' මෙයට වඩා ශ්‍රේෂ්ඨ අන් කිසි ආඥාවක් නැතැ"යි වදාළ සේක. එවිට විනයධරයා උන්වහන්සේට පිළිතුරු දෙමින්, "ගුරුදේවයෙනි, එය සැබෑය. 'උන්වහන්සේ එකම තැනැන් වහන්සේය'යි ඔබ කීවා හරිය. උන්වහන්සේ හැර අන් දෙවි කෙනෙක් නැත. මුළු හෘදයෙන් ද මුළු සිතින් ද මුළු බුද්ධියෙන් ද මුළු වීර්යයෙන් ද උන්වහන්සේට ප්‍රේම කිරීම සහ තමාට මෙන්ම තම අසල්වැසියාට ප්‍රේම කිරීම, දවන යාග පූජා හා වෙනත් පූජා සියල්ලටම වඩා ශ්‍රේෂ්ඨය"යි කීවේය. ඔහු කොතරම් තේරුම් පැහැදුම් ඇතුව පිළිතුරු දුන්නේද යි ජේසුස් වහන්සේ දැක "ඔබ දෙවියන්වහන්සේගේ රාජ්‍යයට නුදුරුව සිටින්නෙහිය"යි ඔහුට වදාළ සේක. ඉන්පසු උන්වහන්සේගෙන් කිසි ප්‍රශ්නයක් අසන්න කිසිවෙකුට ධෛර්යයක් නොවීය.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.